# ක්වාසි මණ්ඩලය සඳහා සාමාජිකයෙකු පත්කිරීම - 2025

# අධිකරණ සේවා කොමිෂන් සභාව

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ ක්වාසි මණ්ඩලයට සාමාජිකයෙකු පත්කිරීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**මූලික සුදුසුකම්**

- වයස අවුරුදු 40ට වැඩි විවාහක මුස්ලිම් පුරුෂයෙකු විය යුතුය
- පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ
- මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරනලද සහතිකයක් දරන මොලවි කෙනෙකු හෝ
- අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ
- නීතිඥවරයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ
- රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරියෙකු විය යුතුය.

  දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකු හට මේ සඳහා අයදුම් කළ නොහැක. (අධිකරණ නිලධාරියෙකු හැර).

**අනෙකුත් සුදුසුකම්**

- අයදුම්කරු ඉස්ලාම් ආගම පිළිපදින්නාවූ මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත හා ඉස්ලාම් නීතිය පිළිබඳ විශේෂිතවූ මනා දැනුමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති පුද්ගලයෙකු විය යුතුය.
- තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

**ගෙවීම්**

ක්වාසි මණ්ඩලයේ සමාජිකයෙකුට රුපියල් 12,000/- ක දීමනාවක් සහ එක් රැස්වීමකට රුපියල් 2,000/- බැගින් මසකට රුපියල් 8,000/- ක උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාවක් ද ගෙවනු ලැබේ.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය**

2025 පෙබරවාරි මස 28 වන දින

**අයදුම් කිරීමට අදාළ විස්තර හා වෙනත් තොරතුරු**

2025.01.31 දිනැති ගැසට් නිවේදනය බලන්න.

ගැසට් පත්‍රයෙහි පළකර ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,**
**ක්වාසි අංශය,**
**අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,**
**තැ.පෙ. 573, කොළඹ 12.**
**0112433119/0112451159.**